# 2.24 දුට්ඨ සහ සවුලු යන රාජනාමයන් පිළිබඳව යළි විමසුමක්

අනුර මනතුංග
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

දුට්ඨගාමිණී හෙවත් දුටුගැමුණු (ක්‍රි.පූ.161-137) රජුගේ නමෙහි **'දුට්ඨ'** යන්න මෙන් ම **V** විජයබාහු (ක්‍රි.පූ.1335-1341) සහ **V** පරාක්‍රමබාහු (ක්‍රි.පූ.1344-1359) යන රජවරුන්ගේ නම් සමග යෙදුණු **'සවුලු'** යන උප පදය පිළිබඳව මෙම ලිපිය මගින් විමසුමට ලක් කෙරේ.

ගාමිණී අභය රජු 'දුට්ඨගාමිණී' යනුවෙන් හැඳින්වූයේ ඔහු තරුණ වියේදී සිය පියාට **'දුෂ්ඨ'** වූ හෙයින් බව මහා වංශයේ සඳහන් වේ. එහෙත් මෙය දුටුගැමුණු වැනි වීරෝධාර රජෙකු වෙනුවෙන් භාවිතවීම කිසිසේත්ම පිළිගත නොහැකි අතර, එය වංශකථාකරු එම වචනයේ අර්ථය නොපැහැදිළි හෙයින් ඒ සඳහා ලබාදුන් අර්ථය බව විශ්වාස කළ හැකිය. එහෙයින් **'නිර්භීත'** යන අර්ථය සහිත සංස්කෘත **'ධෘෂ්ඨා'** යන්නෙන් එය නිපන් බවට පරණවිතාන දක්වන අදහස බෙහෙවින් ප්‍රඥාගෝචරය. එහෙත් පැරණි සමාජයට සිය ශ්‍රේෂ්ඨතම රජුගේ නම සඳහා මුල්වූ සකු වදන තේරුම්ගත නොහැකි වූයේ ඇයිදැයි මෙහිදී මතුවන ගැටලුවකි. මේ පිළිබඳව විමසා බැලීමේදී අපට සොයාගත හැකිවූයේ බුරුම රජවරුන් **'මහා' .ශ්‍රේෂ්ඨ'** යන අර්ථයෙන් 'දුට්ඨ' යන්න විරුදක් ලෙස භාවිත කර ඇති බවයි.

එහෙයින් දුටුගැමුණු රජු සඳහා එය විරුදක් ලෙස බුරුමයෙන් ප්‍රදානය කරන ලද්දක් විය හැකිය යන අදහස ඉදිරිපත් කළ හැකිය. මහාථූපයේ සමාරම්භක උළෙල සඳහා බුරුමයෙන් භික්ෂූන් වැඩම කිරීමත්, රජවරුන් සඳහා විරුද නාම පිරිනැමීම එරට භික්ෂු සමාජයේ සිරිතක් වීමත් මේ අදහසට රුකුලක් ලෙස ගත හැකිය. ඒ අනුව 'දුට්ඨගාමිණී' යනු දුෂ්ඨ ගාමිණී නොව, **.ශ්‍රේෂ්ඨ ගාමිණී.** හෙවත් .මහා ගාමිණී**'** රජු ලෙස අර්ථ ගැන්විය හැකිය.

V විජයබාහු සහ V පරාක්‍රමබාහු රජවරුන් සඳහා යෙදුනු **'සවුලු'** යන පදය විස්තර කරමින් රාජරත්නාකාරය සඳහන් කරන්නේ ශ්‍රී මහා බෝධීන්වහන්සේ වැඩම කරවූ පිරිස සමග පැමිණි සූර්යගුප්ත කුමාරයා සෙබඩ බිජුවකින් උපන් කුමාරිකාවක් සරණ පාවාගත් නිසා බිහිවූ පරපුරට ලැබුණු නමක් ලෙසය. එය යම් භූමියකට යෙදුණු නමක් බවටද තවත් අදහසක් ඇත. එහෙත් **'සවුලු'** යන්න ද බුරුමයේ භාවිත වූ රාජවිරුදක් බව පෙන්වා දියහැකිය.